# කො/විශාඛා විද්‍යාලය කොළඹ - 05
# Co/Visakha Vidyalaya, Colombo - 05

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
**General Certificate of education (Adv. Level) Examination**

12 ශ්‍රේණිය - තුන්වන වාර පරීක්ෂණය - ජූලි 2018
**Grade 12 - 3rd Term Test - 2018 July**

**ආර්ථික විද්‍යාව**
**Economics**

**21 | S | II**

කාලය පැය 03
03 hours

• "අ" කොටසින් ප්‍රශ්න **දෙකක් ද**, "ආ" කොටසින් ප්‍රශ්න දෙකක් ද, ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## "අ" කොටස

(01) (i) හිඟකම සහ සැපයුම් ඌනතාව යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නිදහස් වෙළඳ පොළ ආර්ථිකයක් තුළ කුමන භාණ්ඩ කවර ප්‍රමාණයක් නිෂ්පාදනය කළ යුතුද යන්න තීරණය කිරීමේ බලය හිමිවන්නේ කා හටද විස්තර කරන්න. (ලකුණු 04)

(iii) වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය නිෂ්පාදන හැකියා මායිමක් යොදාගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) වෙළඳ පොළ ආර්ථිකයක ලාභයේ කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 04)

(v) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේදී තීරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය මත ආර්ථික පද්ධති අතර වෙනස්කම් සසඳන්න. (ලකුණු 04)

(02) (i) (අ) සැපයුම් වක්‍රය පහළ සිට ඉහළට බෑවුම් වන්නේ කවර හේතු නිසාද පහදන්න. (ලකුණු 02)

(ආ) ඉල්ලුම් වක්‍රය ඉහළ සිට පහළට බෑවුම් වන්නේ කවර හේතු නිසාද පහදන්න. (ලකුණු 02)

(ii) පහත සංකල්ප අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) ඉල්ලුම් ප්‍රමාණය හා ඉල්ලුම වෙනස්වීම. (ලකුණු 02)

(ආ) බාල භාණ්ඩ හා සුඛෝපභෝගී භාණ්ඩ අතර වෙනස නම්‍යතාව ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් ආධාරයෙන් මිල ඉල්ලුම් නම්‍යතාව මත ව්‍යාපාර අයභාරය වෙනස්වන ආකාරය විමසන්න. (ලකුණු 04)

(iv) සැපයුම් වක්‍රය වමට විතැන් කරන සාධක හා ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් කරන සාධක කවරේ ද? (ලකුණු 04)

(v) වෙළඳ පොළක සමතුලිත මිල තීරණය වන්නේ කෙසේද? රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(03) (i) "පාරිභෝගික අතිරික්තය" හා "නිෂ්පාදක අතිරික්තය" යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) "මිල වෙනස්වන විට ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වන අතර ඉල්ලුම වෙනස්වන විට මිල වෙනස් වේ" මෙම ප්‍රකාශය රූප සටහන් ඇසුරෙන් විමසන්න. (ලකුණු 04)

(iii) භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවූ විට සමාජ ශුභ සාධනය පහළ නොයන්නේ කුමන අවස්ථාවන්හිදී ද? රූප සටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 1000 - 10p$$

$$Qs = -200 + 10p$$

මෙම භාණ්ඩය අලෙවි කළ යුතු අවම මිල රු. 80ක් යැයි රජය තීරණය කොට අධි සැපයුම රජය විසින් මිලදී ගනු ලැබුවහොත්,

(අ) අවම මිල නියම කළ පසු ව්‍යාපාරික අයභාරය කොපමණ ද?

(ආ) අවම මිල නියම කළ පසු පාරිභෝගික පැහැදුම කොපමණ ද?

... නිෂ්පාදක අතිරික්තය හා පාරිභෝගික අතිරික්තය කොපමණ ද?

Scanned by CamScanner

(04) එක්තරා භාණ්ඩයක දේශීය මිල, දේශීය සැපයුම හා අධි සැපයුම් ප්‍රමාණ පහත දැක්වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| මිල රු. | 5 | 10 | 15 | 20 | 25 |
| දේශීය සැපයුම් ප්‍රමාණය (දහස්) | 2 | 6 | 10 | 14 | 18 |
| අධි සැපයුම් ප්‍රමාණය (දහස්) | -12 | -6 | 0 | 6 | 12 |

(i) දේශීය ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්තාරයක අඳින්න. (ලකුණු 02)

(ii) වෙළඳ පොළ සමතුලිත මිල හා ප්‍රමාණ දක්වන්න. (ලකුණු 02)

(iii) රජය මෙම භාණ්ඩ ඒකකයක් අලෙවි කළ හැකි සර්ව උපරිම මිල රු. 12.50ක් යැයි තීරණය කළ හොත්,

(අ) උපරිම කළු කඩ මිල කොපමණ ද?

(ආ) උපරිම මිල යටතේ අධි ඉල්ලුම් ප්‍රමාණය

(ඉ) උපරිම මිල යටතේ පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය

(ඊ) උපරිම මිල පැනවීම නිසා සමාජයට අහිමිවන ශුද්ධ සාරවණය (ලකුණු 08)

(iv) මෙම භාණ්ඩයට උපරිම මිල පැනවීම වෙනුවට ඒකකයක් රු.10 බැගින් විදේශ රටකින් ආනයනය කළ හොත් පහත දෑ ගණනය කර දක්වන්න.

(අ) දේශීය සැපයුම් ප්‍රමාණය

(ආ) දේශීය ඉල්ලුම් ප්‍රමාණය

(ඇ) ආනයනය කරන ඒකක ප්‍රමාණය

(ඈ) ආනයන මිල යටතේ ඉල්ලුම් නම්‍යතාව (ලකුණු 08)

<u>"ආ" උප කොටස</u>

(05) (i) ආර්ථික බැදු කුලිය සහ ආර්ථික ලාභය යන සංකල්ප විස්තර කරන්න. (ලකුණු 04)

(ii) "ප්‍රාමාණික ලාභය නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැයක් ලෙස සැලකේ" මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? (ලකුණු 04)

(iii) නිෂ්පාදන ශ්‍රිතය යනු කුමක් ද? (ලකුණු 02)

(iv) "නිෂ්පාදන න්‍යාය" තුළ කියවෙන කෙටි කාලය සහ දිගු කාලය යන සංකල්ප පැහැදිලි කරන්න. (ලකුණු 04)

(v) පූර්ණ තරඟකාරී වෙළඳපොළක එළවළු ගොවියෙක් මුළු ස්ථාවර පිරිවැය රු. 4000/-ක් ද මුළු විචල්‍ය පිරිවැය රු. 6000/-ක් ද ආන්තික පිරිවැය රු. 50ක්ද වැය කරමින් සතියකට බෝංචි 150kg ක් නිපදවා 1kgක් රු. 50/- වැනි මුදලකට අලෙවි කරයි. ඉහත තොරතුරු වලට අනුව,

(a) පූර්ණ තරඟකාරී ආයතනයක ලාභ උපරිම කරන කොන්දේසිය කුමක් ද? (ලකුණු 02)

(b) දී ඇති තොරතුරුවලට අනුව ආයතනය ලාභ ලබන්නේ ද? අලාභ ලබන්නේ ද? ගණනය කර පෙන්වන්න. (ලකුණු 02)

(c) එසේ නම් මෙම ආයතනය වෙළඳපොළෙන් ඉවත් වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(06) (i) දළ දේශීය නිෂ්පාදිතය අගය කිරීමේලා මූලික මිල, නිෂ්පාදකයින්ගේ මිල හා ගැණුම්කරුවන්ගේ මිල යන සංකල්ප වෙනස්වන ආකාර පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) නිෂ්පාදන ඉමට ඇතුලත්වන ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් කවරේ ද? (ලකුණු 04)

(iii) ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 02)

(iv) කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| • කුටුම්බ පරිභෝජනය | 800 |
| • ලාභ පරමාර්ථයකින් තොර ආයතන මිලදී ගත් පරිභෝජන භාණ්ඩ හා සේවා | 50 |
| • රජයේ පුද්ගල පරිභෝජන වියදම | 120 |
| • රජයේ සාමූහික පරිභෝජන වියදම | 80 |
| • ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 150 |
| • තොග වෙනස්වීම | 30 |
| • වටිනාකම් වෙනස්වීම | 20 |
| • ශුද්ධ අපනයන | -30 |
| • ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | -10 |
| • ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | [illegible] |

Scanned by CamScanner

පහත දෑ ගණනය කරන්න.

(අ) වෙළඳපොළ මිල මත දළ දේශීය නිෂ්පාදිතය

(ආ) වෙළඳපොළ මිල මත දළ ජාතික ආදායම

(ඇ) වැයකළ හැකි ජාතික ආදායම

(ඈ) ජාතික ඉතිරිකිරීම් (ලකුණු 08)

(07) (i) සාර්ව ආර්ථික සමතුලිතය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? විවෘත ආර්ථිකයක සමතුලිතය ඇතිවන ආකාරය සංකේත මගින් දක්වන්න. (ලකුණු 06)

(ii) කිසියම් ආර්ථිකයක ස්වාධීන පරිභෝජන වියදම රු.මි. 200කි. ආදායම 1000ක් වෙනස්වන විට පරිභෝජනය 800ක් වෙනස් වේ. ආයෝජන මට්ටම (I) 100කි.

(අ) මෙම ආර්ථිකයට අදාළ ඉතුරුම් ශ්‍රිතය ගොඩනගන්න.

(ආ) සමතුලිත නිමැවුම් මට්ටම කොපමණ ද? සමතුලිතයේ දී ඉතුරුම් හා ආයෝජනය අතර ඇතිවිය හැකි තත්ත්වය කුමක් ද?

(ඇ) සමතුලිත නිමැවුම මට්ටම බිහිවන ආකාරය ආදායම් හා වියදම් ප්‍රවේශය මගින් ද, ගිලිහීම් හා එකතුවීම් ප්‍රවේශය මගින් ද ප්‍රස්තාරයක දක්වන්න.

(ඈ) මෙම ආර්ථිකයට රජයේ මැදිහත් වීම නිසා ස්වාධීන බදු 100ක් ලෙසද, රජයේ වියදම 100ක් ලෙසද ඇතුලත් වූයේ නම් නව සමතුලිත නිමැවුම් මට්ටම කොපමණ ද?

(ඉ) රාජ්‍ය වියදම් ගුණකය හා බදු ගුණකය කොපමණ ද? (ලකුණු 2 × 5 = 10)

(iii) සමාහාර ඉල්ලුමේ වැඩි වීමක් හේතු කොට ගෙන සමතුලිත ආදායමේ සිදුවන වෙනස සහ ඊට අදාල ගුණකයේ අගය බිහිවන ආකාරය රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(08) (i) විවෘත ආර්ථිකයක ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය ඇසුරෙන් ආර්ථික කාරක අතර අන්තර් සම්බන්ධය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සංවෘත ආර්ථිකයක සමතුලිත ආදායම නිර්ණය වන ආකාරය විදීම් හා කාන්දුවීම් ප්‍රවේශය ඔස්සේ විග්‍රහ කරන්න. (ලකුණු 04)

(iii) වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී තොග වෙනස්වීම් ගලපන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතයේ සංරචක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(v) ජාතික ගිණුම් සකස් කිරීම, ආර්ථිකයට වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 04)

Scanned by CamScanner

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES




Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00